# ශ්‍රී ලාංකේය රාජ්‍යත්වයේ අධිකාරිය හා නීත්‍යානුකූලභාවය තහවුරු කිරීම සඳහා රාජ්‍යත්ව සංකේත ලෙස බෞද්ධාගමික වස්තුවල භූමිකාව පිළිබඳ අධ්‍යයනයක්

ආර්.එච්.එල්. දිසානායක[1]

මුඛ්‍ය පදඃ දේශපාලනය, දළදා වහන්සේ, පාත්‍රා ධාතූන් වහන්සේ, රාජ්‍යත්වය, රාජ්‍ය සංකේත

## හැඳින්වීම

මිනිසා ශිෂ්ටාචාර ගත වූ කාල පරාසයේ සිට ආගම හා දේශපාලනය අතර ඉතා සමීප බැඳියාවක් පැවතුණි. රාජ්‍යත්වය, ස්වෛරීභාවය සහ දේශපාලන බලය නියෝජනය කිරීම සඳහා විවිධ ශිෂ්ටාචාර තුළ විවිධ සංකේත භාවිත කර ඇත. මෙම සංකේත මඟින් රාජකීය අධිකාරිය ශක්තිමත් කර, පාලකයන්ගේ බලය නීත්‍යානුකූල කර, රාජ්‍යය ඒකීයභාවය සහ අනන්‍යතාවය තහවුරු කළහ. කෙසේ වෙතත් දේශපාලනික අධිකාරිය හා ආගමික අධිකාරිය සම්බන්ධ වීමත් සමඟ බොහෝ අවස්ථා වල මෙම අංශ දෙකෙහිම නියෝජනය සංකේතවත් වීමට මෙම සංකේත භාවිත විය. ශිෂ්ටාචාරක සමාජ තුළ ආගම සහ දේශපාලනය සමීපව බැඳී පැවති අතර, පාලකයන් තම අධිකාරිය නීත්‍යානුකූල කිරීම සඳහා ද දේශපාලන බලය ශක්තිමත් කිරීම සඳහා ද පූජ්‍ය වස්තූන් භාවිත කර තිබේ. ශ්‍රී ලංකාවේ දේශපාලන ඉතිහාසය තුළ බෞද්ධ ආගම හා රාජ්‍ය පාලනය අතර පැවති ගැඹුරු සබඳතාවය සෑම යුගයකම අවියෝජනීයව පැවතියේය. බුදුසසුන ලංකාවට පැමිණීමත් සමඟම පාලකයින් තම රාජ්‍ය බලය සහ නීත්‍යානුකූලත්වය බුදු දහම මත පදනම්ව තහවුරු කර ගත් සම්ප්‍රදායක් ආරම්භ විය. මෙම සබඳතාවය පැහැදිලිව දැකගත හැකිවන්නේ, පාලකයින් විසින් බුදුරජාණන් වහන්සේට අයත් ලෙස සැලකෙන පාත්‍රා ධාතු වහන්සේ හා වාම දළදා වහන්සේ වැනි ආගමික වස්තූන් රාජ්‍ය සංකේත ලෙස භාවිත කළ ආකාරයෙනි. මෙම වස්තූන් රජකම සඳහා පමණක් නොව, පොදු ජනතාවගේ ජන ජීවිතය තුළ ඇති ආගමික හා සදාචාරාත්මක වටිනාකම් සඳහා ද සංකේත වශයෙන් මූලිකව භාවිත විය. රජවරුන් මෙම වස්තූන් ආරක්ෂා කරමින් ඒවාට අදාළ චතාවත්, පෙරහැර, පූජා හා ආගමික උත්සවයන් සංවිධානය කිරීමෙන් තම පාලනයට ඇති සදාචාරාත්මක සහ අධ්‍යාත්මික යුක්තිය උදහස් කළහ. ඒ අනුව රාජ්‍ය සංකේතවලින් බලය නියෝජනය කිරීමෙන් පමණක් නොව, රාජ්‍යත්වය නීත්‍යානුකූල වශයෙන් තහවුරු කිරීමද සිදු විය. මෙම පර්යේෂණය හරහා විමර්ශණය කෙරෙන්නේ ශ්‍රී ලාංකීය රාජ්‍ය සංකේතවලින් බුදුන් වහන්සේ හා

[1] ඉතිහාස අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය
hirushadissanayaka2000@gmail.com

මෙම සම්බන්ධ වස්තූන් රාජ්‍ය අධිකාරිය හා නීතිමය උරුමය සමඟ කෙරෙන සබඳතාවයයි. අනුරාධපුර, පොළොන්නරු සහ දඹදෙණි යුගයන් තුළ මෙම සබඳතාවය වර්ධනය වූ ආකාරය විශේෂයෙන් අවධානයට ලක් කරමින්, රාජ්‍ය සංකේත ලෙස ආගමික වස්තූන් වල ඓතිහාසික භූමිකාව මෙහි දී විභාග කෙරේ.

**ක්‍රමවේදය**

පර්යේෂණ මාතෘකාවට අදාළව තොරතුරු විශ්ලේෂණය කිරීමේ දී න්‍යායාත්මක ක්‍රමවේදය භාවිතා කරන ලදී. මෙම පර්යේෂණය ඓතිහාසික පර්යේෂණයකි. ඓතිහාසික මූලාශ්‍රය පරීක්ෂණය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කර මෙම පර්යේෂණය සිදු කෙරේ. මෙම පර්යේෂණය සඳහා ප්‍රාථමික දේශීය, හා විදේශීය සාහිත්‍ය මූලාශ්‍රය හා පුරාවිද්‍යාත්මක මූලාශ්‍රය භාවිතා කර තිබේ. මෙම මූලාශ්‍රය වල සඳහන් තොරතුරු සංසන්දනාත්මකව ඉදිරිපත් කර තිබේ.

**ප්‍රතිඵල හා සාකච්ඡාව**

මෙම පර්යේෂණය මඟින් මූලික අවධානය යොමු වන්නේ ශ්‍රී ලංකාවේ රාජ්‍යත්ව සංකේත ලෙස භාවිත වූ බෞද්ධ ආගමික වස්තූන්, විශේෂයෙන් බුදුරජාණන් වහන්සේගේ පාත්‍රා ධාතූන් වහන්සේ සහ වාම දළදා වහන්සේ තුළින් රාජ්‍ය අධිකාරිය සහ නීත්‍යානුකූල බලය නිරූපණය වී ඇති ආකාරය පිළිබඳවය. මෙවැනි වස්තූන් පාලකයන්ගේ පුණ්‍ය බලය, සදාචාරාත්මක වගකීම සහ නීත්‍යානුකූල පාලනයේ උරුමය මූර්තිමත් කළේය. ඉන්දියාවේ අශෝක අධිරාජ්‍යයාගේ කාලයෙන් ආරම්භ වූ බෞද්ධ සම්ප්‍රදාය ශ්‍රී ලංකාවට හඳුන්වා දීමත් සමඟම, රාජ්‍යය හා බුදුදහම අතර ඇති සම්බන්ධය තවදුරටත් ගැඹුරු විය. ආරම්භයේදී පාත්‍රා ධාතුව දේවානම්පියතිස්ස රජු සමයේ මෙරටට පැමිණි අතර, වාම දළදා වහන්සේ ක්‍රි.ව. 4 වන සියවසේ කිත්සිරිමෙවන් රජු සමයේ මෙරටට ගෙන එන ලදි. මේවා ආගමික වස්තූන් පමණක් නොව, දේශපාලන බලය නියෝජනය කරන සංකේත වශයෙන් භාවිත විය. රජවරුන් මෙවන් වස්තූන් ආරක්ෂා කිරීමේ, පෙරහැර පවත්වන වගකීමෙන් ඔවුන් බුදුදහම ආරක්ෂා කරන සදාචාරාත්මක පාලකයන් ලෙස හැඳින්වූහ.

අනුරාධපුර පොළොන්නරුව සහ දඹදෙණිය යුගවලදී මෙම සංකේත පදනම් වූ සම්ප්‍රදාය තවත් ශක්තිමත් වූ අතර රාජ්‍ය පාලනයට නීත්‍යානුකූල උරුමය තිබේද යන්න තීරණය වුයේ මෙම ධාතූන් සතු වීම මතය. හතරවන මිහිඳු රජු නිශ්ශංකමල්ල රජු සහ දඹදෙණි යුගයේ රචිත "පූජාවලිය" වැනි මූලාශ්‍රය මඟින් මෙම අදහස තහවුරු වේ.

52. "ලක්හි නොබෝසත්හු නො රජ්වන්හයි සැහැකුල කොත් සවැනියමුනිරජ්හු නිය"

53."ත වියාරණ ලද් තුමා පය් සිවුර් රක්නු වස් මහසඟහු පිළිවැසු රජ් සිරි"[13]

පොළොන්නරු යුගයේ දී මෙම අදහසම නිශ්ශංකමල්ල රජු විසින් තම සෙල්ලිපි තුළ වෙනස් ආකාරයකට දක්වා තිබේ.

22."කාලිංගවශයට හිමි ලක්දිවැ බුද්ධ ශාසනයට ප්‍රතිපක්ෂ අබෞද්ධ චොඩ පාඩියාදි රජුන් නො පිහිටිවියැ යුත්තේයැ විජයරාජ කුමාරයන් කෙරෙ පට"

23. "න් ලක්දිව හිමි කාලිහවංශයෙහි රජ දරුවන්ටයැ සොයා ගෙනැ (ත්) වී නම් උන් ස්වාමී කොටැ ලොසසුන් රක්ෂා කරනු ආචාරයි - දහම් නමේ මේ මු"[14]

පොළොන්නරු යුගයේදී පරාක්‍රමබාහු රජු වැනි පාලකයන් දළදා වහන්සේ භාවිත කළේ තම ආධිපත්‍යය තහවුරු කිරීමටය. පරාක්‍රමබාහුගේ මව වූ සුගලා බිසව සතුව දළදා වහන්සේ පැවතීම සමඟ ඇය පහසුවෙන් ජනතා සහය ලබාගත්තේය.

මෙම සාධක අනුව පෙනීයන්නේ දළදා වහන්සේ සහ පාත්‍රා ධාතුන් වහන්සේ වැනි වස්තූන් රාජ්‍ය පාලනයේ නීත්‍යානුකූලභාවය සහ සදාචාරය සංකේතවත් කළ ප්‍රබල රාජ්‍ය සංකේතයන් බවයි. ඒවා රජකම සඳහා අත්‍යවශ්‍ය වස්තූන් වශයෙන් රජවරුන්ගේ දේශපාලන හැඟීම්, බලය සහ සන්නිවේදනයේ සංකේත බවට පත්ව තිබේ. මේ ආකාරයට රාජ්‍ය පාලනයේ සංකේතාත්මක භාණ්ඩ ලෙස දළදා වහන්සේ හා පාත්‍රා ධාතූන්වහන්සේ වැනි වස්තූන් භාවිතය ශ්‍රී ලංකාවේ දේශපාලන සංකේත වෙත කේන්ද්‍රගත වූ අතර ඒවා රජකම සඳහා අත්‍යවශ්‍ය සාධක බවට පත්විය.

ආශ්‍රිත මූලාශ්‍රය

***මහාවංසය***, (1860), සංස්. හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි සහ බටුවන්තුඩාවේ දේවරක්ෂිත, රත්නාකර ප්‍රකාශකයෝ, කොළඹ.

Ranawella G.S, (2004), ***Inscriptions of Ceylon***, Department of archaeology.

Don martino de zilva wickramasinhe, (1928), ***Epigraphia zeylanica (ed) vol II***, oxford university press.

[13] **Inscriptions of Ceylon** (2004) G.S.Ranawella, Department of archaeology p.254.

[14] **Epigraphia zeylanica**, (1928) (ed) vol II, Don martino de zilva wickramasinhe, oxford university press, P.109.